ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

හමුදා පුවත්

# දෙසතිය

2025 ජනවාරි 15 - 31 වෙළුම - 46

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනයකි




www.army.lk

www.youtube.com/
SLArmyMedia

www.facebook.com/
SriLankaArmyDefendersoftheNation

www.x.com/
sri_lanka_army

www.instagram.com/
sl_army

Directorate of Media and Psychological Operations, Army Headquarters | www.army.lk | 0112076967

## යුද්ධ හමුදාධිපතිතුමන් අග්‍රාමාත්‍යතුමිය හමුවෙයි



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී අයිජී 2025 ජනවාරි මස 16 දින කොළඹ පිහිටි අග්‍රාමාත්‍ය කාර්යාලයේදී මෙරට අග්‍රාමාත්‍ය ගරු ආචාර්ය හරිනි අමරසූරිය මෙනෙවිය හමුවිය.

සුහද හමුව අතරතුරදී, එතුමිය යුද්ධ හමුදාධිපතිතුමන්ගේ නව පත්වීම වෙනුවෙන් සුබ පැතුම් එක් කළ අතර, යුද්ධ හමුදාධිපතිතුමන් විසින් එහිදී ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සහ මව්බිමේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදාවේ සහයෝගය ලබාදීමට කැපවී කටයුතු කරන බව වැඩිදුරටත් පැවසීය.

සුහද හමුව සමාප්තියේදී, යුද්ධ හමුදාධිපතිතුමන් අග්‍රාමාත්‍යතුමිය වෙත සමරු තිළිණයක් ප්‍රදානය කළේය.

(ඡායාරූප අනුග්‍රහය: මාධ්‍ය හා සන්නිවේදන අංශය - අග්‍රාමාත්‍ය කාර්යාලය)

## යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ගෞරවාචාරය




ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව නියෝජනය කරනු ලබන සිව්වන යුද්ධ හමුදාධිපති වශයෙන් අභිනවයෙන් ධූරයේ රාජකාරි කටයුතු භාරගත් 25 වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී අයිජී වෙත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ගෞරවාචාරය පුදකරමින් 2025 ජනවාරි මස 17 දින උපහාර පෙළපාළියක් පවත්වන ලදී.

රෙජිමේන්තු මූලස්ථානය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපතිතුමන්, 55 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් බී.ජී.එස්. ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. අනතුරුව, එතුමන් රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී දිවංගත රණවිරුවන් වෙත පුෂ්පෝපහාර පුදකළේය.

02 පිටුවට

## 'ජාතිය නඟාසිටුවීමේ උදාරතර කාර්යභාරයට උරදීම සඳහා ස්වයං විනයකින් සහ සැබෑ කැපවීමකින් රාජකාරියේ නිරත වීම සැමගේ වගකීමයි- වැඩබලන ආරක්ෂක අමාත්‍යය

වර්තමානයේ අප රට මුහුණ දී තිබෙන මෙම අර්බුදකාරී තත්ත්වයෙන් මිදීම සඳහා දැඩි ස්වයං විනයක් පවත්වාගනිමින් සැබෑ කැපවීමකින් යුතුව අපගේ යුතුකම ඉටු කළයුතු බවත්, වගකීමෙන් සහ වගවීමෙන් ක්‍රියා කළයුතු බවත් වැඩබලන ආරක්ෂක අමාත්‍ය මේජර් ජෙනරල් අරුණ ජයසේකර (විශ්‍රාමික) කොළඹ යුද්ධ හමුදා රෝහලේ සිදුකළ නිරීක්ෂණ සංචාරය අතරතුරදී නිලධාරීන් සහ සෙසුනිලයන් ආමන්ත්‍රණය කරමින් ඊයේ (ජනවාරි මස 16) දින ප්‍රකාශ කළේය.

යුද්ධ හමුදා රෝහල් පරිශ්‍රය වෙත සපැමිණි මේජර් ජෙනරල් අරුණ ජයසේකර (විශ්‍රාමික), යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී සහ රෝහල් බලධාරීන් විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. අනතුරුව, රෝහලේ වාට්ටු කිහිපයක් සහ අනෙකුත් පහසුකම් පිළිබඳ නිරීක්ෂණ චාරිකාවක නිරත වීමෙන් පසු රෝහල් අධ්‍යක්ෂතුමන් විසින් සිදුකළ දැනුවත් කිරීමේ හමුවකට ද එතුමන් සහභාගී විය.

02 පිටුවට



## යුද්ධ හමුදාධිපතිතුමන් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ විශිෂ්ටයින් අතරට

උසස් ආරක්ෂක අධ්‍යයන අංශයේ ප්‍රමුඛතම ස්ථානයක් හිමි සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 'පවුරේ කීර්තිය' (Wall of Fame) වෙත ඇතුළත් කළ වත්මන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ඡායාරූපය එතුමන්ගේ සුරතින් නිරාවරණය කරන ලදී.

විද්‍යාල පරිශ්‍රය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපතිතුමන් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරල් එච්.එච්.කේ.එස්.එස්. හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී.

03 පිටුවට




## යුද්ධ හමුදාවේ රණක්ෂිතයට පත් ප්‍රවීණයන් වෙනුවෙන් වෛද්‍ය කඳවුරක්

යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ යහපැවැත්ම සහතික කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ මඟපෙන්වීම මත කොළඹ පළාතේ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශයන්හි වෙසෙන යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ සෞඛ්‍යය අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් 2025 ජනවාරි මස 20 සිට 24 දින දක්වා රාගම රණවිරු සෙවණ සුවතා නිකේතන පරිශ්‍රයේදී රණක්ෂිතයට පත් යුද්ධ හමුදා ප්‍රවීණයන් වෙනුවෙන් වෛද්‍ය කඳවුරක් පැවැත්වීම සඳහා සියලු කටයුතු සංවිධානය කර ඇත.

03 පිටුවට

## දකුණු සුඩානයේ දෙවන මට්ටමේ රෝහලෙහි රාජකාරි සඳහා 11 වන ශ්‍රී ලංකා වෛද්‍ය කණ්ඩායම දිවයිනෙන් පිටව යයි

දකුණු සුඩානයේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය විසින් පවත්වාගෙන යනු ලබන දෙවන මට්ටමේ රෝහලෙහි සාමසාධක රාජකාරි කටයුතු ආරම්භ කිරීම සඳහා 11 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායම බ්‍රහස්පතින්දා (13) දින දිවයිනෙන් පිටව යන ලදී.

11 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායමේ අණදෙන නිලධාරි ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ ලුතිනන් කර්නල් ආර්.එම්.ඩී.බී රාජපක්ෂ යූඑස්පී කටයුතු කරන අතර දෙවන අණදෙන නිලධාරි වශයෙන් ලුතිනන් කර්නල් කේ.ඩී.පී.ඩී.ඊ.ඒ විජේසිංහ කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායම, යුද්ධ හමුදා නිලධාරීන් 16 දෙනෙකු, නාවික හමුදා නිලධාරීන් දෙදෙනෙකු සහ සෙසුනිලයන් 46 දෙනෙකුගෙන් සමන්විත වේ.

11 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායම දිවයිනෙන් පිටත්ව යාමට ප්‍රථම 2025 ජනවාරි මස 31 සිකුරාදා දින වේරහැර පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන සරඹ භූමියේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී වෙත හමුදා සම්ප්‍රදායානුකූලව ගෞරවාචාර පුදකළහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ බලකාධිපති මේජර් ජෙනරල් ඩී.කේ.එස්.කේ දොලගේ යූඑස්පී පීඑස්සී සහ මධ්‍යස්ථාන සේනාවිධායකතුමන් මෙම අවස්ථාවට සහභාගි වූ අතර, දිවයිනෙන් පිටත්ව යන හමුදා සාමාජිකයන්ගේ පවුල්වල සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් ඔවුන් දිරිගැන්වීම සඳහා ගුවන් තොටුපළ පරිශ්‍රය වෙත පැමිණ සිටියහ.

එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ අඛණ්ඩ සහභාගිත්වය තුළින් ගෝලීය සාමය සහ ස්ථාවරත්වය සඳහා ශ්‍රී ලංකාවේ අඛණ්ඩ දායකත්වය මැනවින් පිළිබිඹු කෙරේ. දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට සහ ප්‍රාදේශීය ජනතාව වෙත වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමේදී දෙවන මට්ටමේ රෝහල තීරණාත්මක






# 'ජාතිය නඟාසිටුවීමේ උදාරතර කාර්යභාරයට උරදීම සඳහා ස්වයං විනයකින් සහ සැබෑ කැපවීමකින් රාජකාරියේ නිරත වීම සැමගේ වගකීමයි- වැඩබලන ආරක්ෂක අමාත්‍යය

1 පිටුවෙන්

යුද්ධ හමුදා රෝහල තුළින් ඉටුවන විශිෂ්ඨ සේවාව ඇගයූ වැඩබලන ආරක්ෂක අමාත්‍යතුමන් දූෂණයෙන් තොර දේශපාලන සංස්කෘතියක අවශ්‍යතාවය පිළිබඳ අවධාරණය කළේය. එමෙන්ම, සියලු පුරවැසියන්ගේ දෛනික ජීවිත වලට අහිතකර බලපෑම් ඇතිවීමට හේතු වී තිබෙන මෙම සමාජීය හා ආර්ථික අර්බුදයෙන් රට ගොඩගැනීමට නම් නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද එතුමන් ප්‍රකාශ කළේය. එකී අරමුණු මුදුන් පමුණුවාගැනීම සඳහා රජය වෙතින් 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන හඳුන්වා දී තිබෙන බවද එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය.

පසුව, වැඩබලන ආරක්ෂක අමාත්‍යතුමන් යුද්ධ හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්, රෝහල් කාර්ය මණ්ඩලය සහ රෝහල වෙත පැමිණ සිටි පිරිස් සමඟ සුහද පිළිසඳරක ද නිරත විය.

සිය ධුරයේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව යුද්ධ හමුදා රෝහලේ සිදුකළ ප්‍රථම නිල සංචාරය සනිටුහන් කරමින් මේජර් ජෙනරල් අරුණ ජයසේකර (විශ්‍රාමික) විශේෂ අමුත්තන් සඳහා වූ පොතේ සමරු සටහනක් ද තැබීය.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරල් චන්දන වික්‍රමසිංහ ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ රෝහලේ වෛද්‍ය හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් ද සහභාගී වූහ.







# යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ගෞරවාචාරය

1 පිටුවෙන්

ඉන් අනතුරුව, යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පුදකළ අතර 6 කාරක රෙජිමේන්තුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සරඹ භූමියේදී එතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල රෙජිමේන්තු පෙළපාලියේ ගෞරවාචාරය පුදකෙරිණි. එම පෙළපාලියේ පෙළපාලි අණදෙන්නා වශයෙන් 11 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් කේ.ඒ.යූ. කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී කටයුතු කරනු ලැබීය. පසුව, මෙම අවස්ථාව සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් කඳවුරු පරිශ්‍රයේ පැළයක් ද රෝපණය කළේය.

ඉන් අනතුරුව, පැවති සියලු නිල තේ පැන් සංග්‍රහයකට සහභාගි වූ යුද්ධ හමුදාධිපතිතුමන් එම රෙජිමේන්තු භටපිරිස් සමඟ සුහද පිළිසඳරක ද නිරතවිය. උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින්, යුද්ධ හමුදාධිපතිතුමන් විශේෂ අමුත්තන් සඳහා වූ පොතේ සමරු සටහනක් ද තැබීය.

මෙම අවස්ථාව සඳහා හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරල් සී.එස්. වීරසූරිය (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ අයිජී, විධායක ජෙනරාල් සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරල් කේ.වී.එන්.පී. ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරින්, ජ්‍යෙෂ්ඨ නිලධාරින් මෙන්ම ඔවුන්ගේ භාර්යාවන්, නිලධාරින් සහ සෙසුනිලයන් රැසක් සහභාගි වූහ.






# යුද්ධ හමුදා භටපිරිස් මූලිකත්වයෙන් පන්සියගම ග්‍රාමීය රෝහලේ ඉදිකිරීම් කටයුතු නිම කරයි

ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් හා අනුමැතිය මත යුද්ධ හමුදාධිපතිතුමන්ගේ මඟ පෙන්වීම යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැල්සිරිපුර, පන්සියගම ග්‍රාමීය රෝහලේ ඉදිකිරීම් කටයුතු 9 (ස්වේච්ඡා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සිදුකරන ලදී.

මෙම ව්‍යාපෘතිය ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ විජයබාහු පාබල රෙජිමේන්තුවේ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් පිරිස්හි සහායද ඇතිව 2022 ජුනි මස 26 දින ආරම්භ කරන ලදී. ප්‍රදේශයේ සෞඛ්‍ය සේවාවන් වැඩිදියුණු කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් නිම කරන ලද මෙම ගොඩනැගිල්ල 2024 දෙසැම්බර් මස 31 දින රෝහල් බලධාරීන් වෙත නිල වශයෙන් භාර දෙනු ලැබීය.







# යුද්ධ හමුදාධිපතිතුමන් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ විශිෂ්ටයින් අතරට

1 පිටුවෙන්


පසුව, එම විද්‍යාලයේ 'පවුරේ කීර්තිය' (Wall of Fame) නම් කීර්තිමත් පුද්ගලයින්ගේ ඡායාරූප එළිදැක්වීම අලංකාරවත් කරමින් එහි ස්ථාපිත කළ සිය ඡායාරූපය නිරාවරණය කිරීම සඳහා යුද්ධ හමුදාධිපතිතුමන් කැඳවාගෙන යනු ලැබීය. ඉන් අනතුරුව, යුද්ධ හමුදාධිපතිතුමන් එම විද්‍යාලයේ පවත්වනු ලැබූ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලා අංක - 19 සඳහා සහභාගි වූ නිලධාරින් ආමන්ත්‍රණය කළේය. එම අවස්ථාව සඳහා දේශීය හමුදා නිලධාරින් 125 දෙනෙකු සහ විදේශීය හමුදා නිලධාරින් 26 දෙනෙකු සහභාගි වූහ. එහිදී, යුද්ධ හමුදාධිපතිතුමන් සිය අත්දැකීම් සහ තීක්ෂණ බුද්ධිය එම නිලධාරින් සමඟ බෙදාගත් අතර, ඔවුන් දිරිමත් කරමින් වෘත්තීය හමුදා අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව අවධාරණය කළේය.

මෙම අවස්ථාවේදී, එම විද්‍යාලයේ සේනාවිධායකතුමන් විසින් යුද්ධ හමුදාධිපතිතුමන් වෙත සිය ගෞරවාචාරය පුදකරමින් සමරු තිළිණයක් ප්‍රදානය කළ අතර ඒ වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිතුමන් සිය කෘතඥතාවය පුදකරනු ලැබීය.

ඉන් අනතුරුව පැවති සුහද තේ පැන් සංග්‍රහයකට සහභාගි වූ යුද්ධ හමුදාධිපතිතුමන් එම විද්‍යාලයේ පාඨමාලාවන් සඳහා සහභාගිවූවන් සමඟින් සුහද පිළිසඳරක නිරතවිය. පසුව, එතුමන් විශේෂ අමුත්තන් සඳහා වූ පොතේ මෙම අවස්ථාව හා සබැඳිව සටහනක් ද තැබීය.

උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින්, ගනු ලැබූ සමූහ ඡායාරූපයක් සඳහා ද යුද්ධ හමුදාධිපතිතුමන් සහභාගි විය.

මෙම අවස්ථාව සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින්, නිලධාරින් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගි වූහ.



# 61 පාබල සේනාංකයේ මූලිකත්වයෙන් මාතර ප්‍රදේශයේ වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක්

'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' තේමාව පෙරදැරි කරගනිමින් රජය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහනට සමගාමීව 61 පාබල සේනාංකයේ භටපිරිස් විසින් 2025 ජනවාරි මස 16 දින මාතර, දෙවිනුවර සහ දික්වැල්ල ප්‍රදේශයන්හිදී වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනකට සිය දායකත්වය ලබාදෙන ලදී.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් සංවිධානය කරනු ලැබූ මෙම වැඩසටහන රාජ්‍ය නිලධාරින් සහ සිවිල් වැසියන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

මේජර් ජෙනරල් කේ.ටී.පී. ද සිල්වා ආර්එස්පී එන්ඩියු පීඑස්සී ගේ මඟපෙන්වීම සහ 613 පාබල බලසේනාවේ බලසේනාධිපතිතුමන්ගේ අධීක්ෂණය මත ක්‍රියාත්මක කෙරුණු මෙම වැඩසටහනේදී මාතර, දික්වැල්ල, හිරිකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ස්ථාන 18 ක් තුළ භටපිරිස් විසින් වෙරළ තීරයන් පිරිසිදු කරනු ලැබූහ.

මෙම වැඩසටහන සඳහා 9 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 3 (ස්වේච්ඡා) බලඇණිය ගැමුණු හේවා බලකායේ භටපිරිස් 104 දෙනෙක්, රාජ්‍ය නිලධාරින් සහ සිවිල් වැසියන් රැසක් සහභාගි වූහ.



# '2024 ජාතික වෙරළ සෙපැක්ටැක්රෝ ශූරතාවලියෙහි ජය යුද්ධ හමුදාවට

ශ්‍රී ලංකා ජාතික සෙපැක්ටැක්රෝ සංගමය වෙතින් සංවිධානය කරනු ලැබූ '2024 ජාතික වෙරළ සෙපැක්ටැක්රෝ ශූරතාවලිය 2025 ජනවාරි මස 19 දින ගල්කිස්ස වෙරළ තීරයේදී පැවැත්විණි. තරඟාවලියේ පිරිමි සහ කාන්තා කාණ්ඩයන් දෙකෙහිම ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි සහ කාන්තා සෙපැක්ටැක්රෝ කණ්ඩායම් සමත්වූහ.

යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති මේජර් ජෙනරල් කේ.ඒ.යූ. කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ මඟපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙපැක්ටැක්රෝ කණ්ඩායම් මෙම තරඟාවලිය සඳහා සහභාගි වී මෙම ජයග්‍රහණයන් හිමිකරගත්හ.



# යුද්ධ හමුදාවේ රණක්ෂිතයට පත් ප්‍රවීණයන් වෙනුවෙන් වෛද්‍ය කඳවුරක්

*1 පිටුවෙන්*

රණවිරු සේවා සහ පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් කළමනාකරණය කරනු ලබන මෙම වෛද්‍ය කඳවුර විශේෂයෙන් අත් පා අහිමිවීම හේතුවෙන් කෘතීම අත් පා සහ ශල්‍ය උපකරණ අවශ්‍යතා සහිත මෙන්ම වෛද්‍ය අභියෝගවලට මුහුණ දී සිටින වසර 22 කට අධික සේවා කාලයක් සහිත යුද්ධ හමුදා ප්‍රවීණයන්ට සහ සේවයේ නියුතු රණවිරුවන් වෙනුවෙන් අත්‍යවශ්‍ය වෛද්‍ය ආධාර සැපයීම අරමුණු කරගනිමින් පවත්වනු ලබයි.

මෙම වෛද්‍ය කඳවුර තුළින් අඛණ්ඩව පවතින වෛද්‍ය ගැටලු තක්සේරු කිරීම සහ ඒ සඳහා විසඳුම් ලබාදීම සඳහා වෘත්තීය සෞඛ්‍යය උපදේශන ඇතුළු සේවාවන් රැසක් සපයනු ලබයි. එසේම, මේ තුළින් කෘතිම අත් පා සහ ශල්‍ය උපකරණ නිසි අයුරින් ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා එම උපකරණ පරීක්ෂා කිරීම සහ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම වැනි සේවාවන් ද ලබාදෙනු ලබයි. මීට අමතරව, මානසික සෞඛ්‍යය සහ චිත්තවේගීය යහපැවැත්මට සහයවීම සඳහා උපදේශන සේවාවන් මෙන්ම, පෝෂණ විශේෂඥයින් විසින් සමස්ත සෞඛ්‍යය සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ආහාර ලබාගැනීමේ රටාවන් පිළිබඳ උපදේශනයන් ද මෙහිදී ලබාදීමට කටයුතු සූදානම් කර ඇත.

දිනකට යුද්ධ හමුදා සාමාජිකයන් 500 දෙනෙකු වෙත වෛද්‍ය සේවාවන් සපුරාලීමේ අරමුණින් පවත්වනු ලබන මෙම වෛද්‍ය කඳවුර තුළදී වෛද්‍යවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් වෛද්‍ය පරීක්ෂණ පවත්වනු ලබයි. චර්ම රෝග සහ දන්ත සේවා සඳහා විශේෂඥ සායනයන් ද ඒ තුළින් ලබාගත හැකි අතර, විශේෂයෙන් යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් එම සේවාවන් සපයනු ලබයි.

විශ්‍රාම ගැනීමෙන් පසු වෛද්‍ය සායනයන් සහ සෞඛ්‍යය සේවාවන් ලබාගැනීමේදී හමුදා ප්‍රවීණයන් නිරන්තරයෙන් මුහුණ දෙන අභියෝග සඳහා විසඳුම් ලබාදීම මෙන්ම එම වෛද්‍ය ආධාර ලබාදීම තුළින් ඔවුන්ගේ විභව සංකූලතා වැළැක්වීම සහ ජීවන තත්ත්වය නඟාසිටුවීම යුද්ධ හමුදාවේ ප්‍රධාන අරමුණ වේ. තවද, කෘත්‍රිම අත් පා නඩත්තුව කෙරෙහි වෛද්‍ය කඳවුරේ ප්‍රධාන අවධානය යොමුකිරීම තුළින් කාලෝචිත අළුත්වැඩියාවන් සිදුකිරීමෙන් එම උපකරණ වල ආයු කාලය දීර්ඝ වීම මඟින් ආර්ථිකමය වශයෙන් ඔවුන් වෙත සහන සැලසෙන අතර, ඒ තුළින් තිරසාර සම්පත් කළමනාකරණය පිළිබඳ යුද්ධ හමුදාවේ කැපවීම පෙන්නුම් කරයි.







# විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක - 76 සහ ප්‍රතිත්‍රස්ත හා කැලෑබද සටන් පාඨමාලා [සෙසුනිල] අංක - 38 සාර්ථකව අවසන්

විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක - 76 සහ ප්‍රතිත්‍රස්ත හා කැලෑබද සටන් පාඨමාලා (සෙසුනිල) අංක - 38 සාර්ථකව හැදෑරූ නිලධාරින් 16 දෙනෙකු සහ සෙසුනිලයන් 263 දෙනෙකුගේ විසිරයාමේ උත්සවය 2025 ජනවාරි මස 15 දින මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේදී පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ පාබල අධ්‍යක්ෂ ජෙනරාල් සහ ගැමුණු හේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරල් ඩබ්ලිව්.බී.ජේ.කේ. විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් පෙළපාලිය නිරීක්ෂණය කරන ලදී. ඉන් අනතුරුව, ප්‍රධාන ආරාධිත අමුත්තා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ නිලධාරින් එක්ව පාඨමාලාවන් සඳහා සහභාගී වූවන් වෙත පාඨමාලා ලාංඡන පළඳවනු ලැබූහ.

පාඨමාලාවන්හි විශිෂ්ඨ දක්ෂතා දැක්වූ නිලධාරින් සහ සෙසුනිලයන් පහතින් දැක්වේ:

විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක - 76

- සෑම අතින්ම අතිශූර සිසුවා (නිලධාරි) - 16 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කපිතන් ආර්.පී.ජී.එස්.එම්. ජයසේකර

- දක්ෂතම වෙඩික්කරු - 8 බලඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ ලුතිනන් ආර්.ඒ.එම්.එස්.ඩී. රත්නායක

- සෑම අතින්ම අතිශූර සිසුවා (සෙසුනිල) - 16 බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රයිෆල් සෙබළ ඩබ්ලිව්.පී.සී. රසිඳු

- හොඳම ශාරීරික යෝග්‍යතාවය හෙබි සෙබළා - 5 බලඇණිය ගජබා රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ඩබ්ලිව්.එස්.කේ. විජේතුංග

- හොඳම ඛණ්ඩය - 19 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව

ප්‍රතිත්‍රස්ත හා කැලෑබද සටන් පාඨමාලා (සෙසුනිල) අංක - 38

- සෑම අතින්ම අතිශූර සිසුවා - 1 බලඇණිය විශේෂ බලකායේ කෝප්‍රල් එච්.ඒ.පී. පියුමාල්

මෙම අවස්ථාව සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින්, නිලධාරින් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගී වූහ.





# ආරක්ෂසේනා මූලස්ථානය - නැගෙනහිර භටපිරිස් හානියට පත් වීරයාඩි වැවේ වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කරයි

24 පාබල සේනාංකය යටතේ ස්ථාපිත 241 පාබල බලසේනාවට අයත් 18 බලඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටපිරිස් විසින් 2025 ජනවාරි මස 19 දින හානියට පත් වීරයාඩි වැවේ වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කරනු ලැබීය. එම ප්‍රදේශවාසීන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් වැව් බැම්ම තවදුරටත් ඛාදනය වීම වැළැක්වීම සඳහා භටපිරිස් විසින් එම වැව් බැම්ම තුළ වැලි කොට්ට අතුරනු ලැබීය.







# ආරක්ෂක සේවා එල්ලේ තරඟාවලිය - 2025 හි ජයග්‍රහණය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට

ආරක්ෂක සේවා එල්ලේ තරඟාවලිය - 2025 හි ජයග්‍රහණය අඛණ්ඩව සිව්වන වරටත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් හිමිකර ගන්නා ලදී.

ශ්‍රී ලංකා නාවික හමුදා එල්ලේ කමිටුව විසින් සංවිධානය කරන ලද මෙම තරඟාවලිය ජනවාරි මස 21 දින සිට 23 දින දක්වා වැලිසර, නවලෝක ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ කණ්ඩායම් මෙම තරඟාවලිය සඳහා තරඟ වැදුණු අතර, අවසන් මහා තරඟයේදී යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම නාවික හමුදා එල්ලේ කණ්ඩායම පරාජය කරමින් ශූරතාවය හිමිකර ගත්හ. පළමු ඉනිමේදී යුද්ධ හමුදා ක්‍රීඩකයින් ලකුණු 14 ක් ලබාගනු ලැබීය.

යුද්ධ හමුදාවේ මෙම ජයග්‍රහණයට අමතරව, හොඳම පිතිකරු සහ තරඟාවලියේ හොඳම ක්‍රීඩකයා ලෙස සුවිශේෂී දස්කම් දැක්වූ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ ලාන්ස් කෝප්‍රල් කේ.අයි ලක්මාල්ට ගෞරවනීය සම්මාන දෙකක් ද පිරිනමන ලදී.

ආරක්ෂක සේවා එල්ලේ තරඟාවලිය මෙරට ත්‍රිවිධ හමුදාවේ මළල ක්‍රීඩා දක්ෂතා සහ සුහදත්වය සංකේතවත් කරමින් අඛණ්ඩව පවත්වනු ලබයි.







# හොරොව්පොතාන ප්‍රදේශයේ ගංවතුරින් අවතැන් වූවන්ට 21 පාබල සේනාංකයේ භටපිරිස් සහන සලසයි

21 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් ඩබ්ලිව්.එම්.එස්.සී.කේ. වනසිංහ ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම සහ 212 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බී.ඒ.පී.එම්. බාලසූරිය ආර්එස්පී ගේ අධීක්ෂණය මත 4 බලඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් විසින් අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් හානියට පත් ගල්කුලම, මහනොච්චිකුලම් වැව් බැම්ම තුළ වැලි කොට්ට අතුරා ප්‍රතිසංස්කරණය කරනු ලැබීය.

එමෙන්ම, 211 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටී.ඩී.පී. සිරිවර්ධන පීඑස්සී ගේ අධීක්ෂණය මත 5 (ස්වේච්ඡා) බලඇණිය ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් හොරොව්පොතාන කිරිඉබ්බා වැව් බැම්ම තුළ වැලි කොට්ට අතුරා අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලැබීය.

මීට අමතරව, හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ලබාදුන් සලාක ද්‍රව්‍ය භාවිතා කරමින් 5 (ස්වේච්ඡා) බලඇණිය ගජබා රෙජිමේන්තුව වෙතින් දිවා ආහාර පාර්සල් 300 කට අධික ප්‍රමාණයක් සකස්කර ගංවතුරෙන් අවතැන් වූවන් වෙත බෙදාදීම සඳහා හොරොව්පොතාන ප්‍රදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදෙන ලදී.

මේ අතර, 2025 ජනවාරි මස 19 දින වෙහෙරතැන්න පාලමේ අඩි 6 ක පමණ ප්‍රමාණයක් ජලයෙන් යටවීම හේතුවෙන් එම පාලම තුළින් ප්‍රදේශවාසීන්ට ප්‍රවාහන පහසුකම් සිදුකිරීම සඳහා 5 (ස්වේච්ඡා) බලඇණිය ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් වෙත සිය සහයෝගය ලබාදෙන ලදී.

මෙම අවස්ථාවන් සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, සෙසුනිලයන් සහ සිවිල් වැසියන් පිරිසක් සහභාගි වූහ.

213 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පී.එම්. ද සිල්වා ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය මත 2 බලඇණිය යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ භටපිරිස් 2025 ජනවාරි මස 20 දින හානියට පත් පලුගස්වැව, සින්නසිට්ටිකුලම් වැවේ වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කළහ.

මේ අතර, හොරොව්පොතාන ඇල්ල මාර්ගය ජලයෙන් යටවීම හේතුවෙන් 5 (ස්වේච්ඡා) බලඇණිය ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් 2025 ජනවාරි මස 20 දින යුනිබෆල් රථ භාවිතා කරමින් එම ප්‍රදේශයේ ගමනාගමන කටයුතු යථා තත්ත්වයට පත්කරනු ලැබීය.




# ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේ පැවති සැඟවුණු වෙඩික්කරු පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්

දියතලාව, ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේදී පැවති සැඟවුණු වෙඩික්කරු පුහුණු පාඨමාලාව - 22 හි නිල ලාංඡන පැළඳවීමේ සහ විසිරයෑමේ පෙළපාලිය 2025 ජනවාරි මස 25 දින පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා ආඥාපති - මධ්‍යම මේජර් ජෙනරල් ඩී.කේ.එස්.කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී සහභාගි විය.

උත්සවය අතරතුරදී, ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සුරතින් පාඨමාලාව හැදෑරූවන් වෙත සහතිකපත් සහ සම්මාන ප්‍රදානය කරමින් සිය සුබපැතුම් එක්කළේය. නිලධාරීන් 5 දෙනෙක් හා සෙසුනිලයන් 11 දෙනෙක් ඉන්දියානු යුද්ධ හමුදාව සහ මාලදිවයින් ජාතික ආරක්ෂක බලකාය නියෝජනය කරන සෙසුනිලයන් 6 දෙනෙක් මෙම පාඨමාලාව සඳහා සහභාගි වී සැඟවුණු වෙඩික්කරුවන් ලෙස සුදුසුකම් ලැබූහ.

පහත සඳහන් නිලධාරීන් සහ සෙසුනිලයන් වෙත ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සුරතින් විශේෂ ගෞරව පිරිනැමිණි:

■ හොඳම රණබිම් ක්‍රම - ඉන්දියානු යුද්ධ හමුදාවේ නායික් වීර් සිං

■ හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් හෙබි සෙබළා - විශේෂ බලකායේ කෝප්‍රල් ටී.එම්.ඩී.එස්.බී ඉලංගරත්න

■ හොඳම වෙඩික්කරු - ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලාන්ස් කෝප්‍රල් ආර්.පී. නුවන්

■ හොඳම විදේශීය හමුදා ශිෂ්‍යයා - ඉන්දියානු යුද්ධ හමුදාවේ නායික් වීර් සිං

■ හොඳම සැඟවුණු වෙඩික්කරු - විශේෂ බලකායේ කපිතන් ඒ.එම්.ආර්.කේ.කේ මුල්ලේගම

එසේම, ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්.පී මුනිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් 2025 ජනවාරි මස 26 දින මෙම පාඨමාලාවේ සමාප්ති දේශනය පවත්වන ලදි. මෙම අවස්ථාවට ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, සෙසුනිලයන් සහ සිවිල් වැසියන් රැසක් සහභාගි වූහ.



## 18 බලඇණිය ගැමුණු හේවා බලකායේ හටපිරිස් හානියට පත් අලවත්ත කුඹුර වැව්බැම්ම ප්‍රතිසංස්කරණය කරයි

මොණරාගල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉල්ලීමකට අනුව 18 බලඇණිය ගැමුණු හේවා බලකායේ හටපිරිස් විසින් කරගහවෙල ගම්මානයේ ගොවි ජනතාව සමඟ එක්ව 2025 ජනවාරි මස 26 දින බිබිල, අලවත්ත කුඹුර වැව්බැම්ම ඛාදනය වීම සාර්ථකව වළක්වාගනු ලැබීය.

12 පාබල සේනාංකයේ සේනාංකාධිපතිතුමන්ගේ මඟපෙන්වීම මත හටපිරිස් විසින් හානියට පත් එම වැව්බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන ලදී.




## ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ මූලිකත්වයෙන් කුරුණෑගල දුම්රිය ස්ථානය පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වයි

යුද්ධ හමුදාධිපතිතුමන්ගේ මඟපෙන්වීම සහ වයඹ පළාත් ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණය යටතේ, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හටපිරිස් 2025 ජනවාරි මස 28 දින කුරුණෑගල දුම්රිය ස්ථානයේ දී පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනට සමඟාමීව සිදුකරන ලද මෙම වැඩසටහන ආරක්ෂක සේනා ආඥාපති - නැගෙනහිර සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපතිතුමන් හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායකතුමන් විසින් අධීක්ෂණය කරන ලදී.

මෙම වැඩසටහනට දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහභාගීත්වයෙන් යුතුව යුද්ධ හමුදා හට පිරිස් 30 දෙනෙක් සහභාගි වූහ.







## 23 පාබල සේනාංකයේ හටපිරිස් අයහපත් කාලගුණයෙන් අවතැන් වූවන් මුදවාගනී

231 පාබල බලසේනා බලප්‍රදේශයේ ස්ථාපිත 12 බලඇණිය ගැමුණු හේවා බලකායේ හටපිරිස් විසින් 2025 ජනවාරි මස 19 දින අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් අවතැන් වූ දිවුල්පතන ප්‍රදේශවාසීන් තිදෙනෙකු මුදවාගනිමින් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන ලදී.










## 10 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් හානියට පත් තෙන්නියන්කුලම් වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කරයි

පවතින අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන්, තෙන්නියන්කුලම් වැව් බැම්මේ පිටවානේ කොටසට සිදුවූ හානියෙන් ඇති විය හැකි තත්ත්වයන්ට කඩිනමින් මුහුණ දීමට 56 පාබල සේනාංකයේ සේනාංකාධිපතිතුමන්ගේ උපදෙස් මත, 561 පාබල බලසේනාවේ බලසේනාධිපතිතුමන්ගේ මඟපෙන්වීම යටතේ 10 බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් කේ.ඒ.කේ හේවාපතගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ එම ඒකකයේ හටපිරිස් විසින් 2025 ජනවාරි මස 19 දින එම වැව් බැම්ම සාර්ථකව අලුත්වැඩියා කරන ලදී.

නිලධාරීන් 03 දෙනෙකු සහ සෙසුනිලයන් 30 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ප්‍රදේශයේ අදාළ රාජ්‍ය නිලධාරීන්ගේ සහ ප්‍රදේශ වාසීන් 100 කට ආසන්න සංඛ්‍යාවකගේ සහයෝගය ඇතිව, මෙම අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබීය.










## ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) මූලිකත්වයෙන් නිවාස අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් නව නිවසක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන සේනාවිධායක සහ ආරක්ෂක සේනා ආඥාපති - බටහිර මේජර් ජෙනරල් ඒ.එච්.එල්.ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරගම, වල්ගම ප්‍රදේශයේ පදිංචි එම්. නිලූෂා කුමාරි මෙනෙවිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් නවතමයෙන් ඉදිකරනු ලැබූ නිවස 2025 ජනවාරි මස 22 දින නිල වශයෙන් භාරදීම සිදුකරනු ලැබීය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වන සංවත්සර දිනයට සමගාමීව ආරක්ෂක සේනා ආඥාපති - බටහිරගේ උපදෙස් මත මෙම නව නිවස ඉදිකර භාරදෙන ලදී.

14 පාබල සේනාංකයේ සේනාංකාධිපතිතුමන්ගේ සහ 612 පාබල බලසේනාවේ බලසේනාධිපතිතුමන්ගේ අධීක්ෂණය යටතේ 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ හටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් මෙම නව නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබීය.

නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය සහ දේශීය පරිත්‍යාගශීලීන්ගේ මූල්‍යමය හා අමුද්‍රව්‍යමය දායකත්වය හිමිවූහ.

උත්සවය අතරතුරදී, ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් ප්‍රතිලාභී පවුල වෙත සිය සුබපැතුම් එක්කරමින් නව නිවසේ යතුරු භාරදෙනු ලැබූ අතර, නිවස සාර්ථකව ඉදිකර අවසන් කිරීම සඳහා අනුග්‍රාහකත්වය ලබාදුන් අයවළුන් සහ ශ්‍රමදායකත්වය ලබාදුන් හටපිරිස්හි කැපවීම අගය කළේය.

උත්සව අවස්ථාවට 14 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් කේ.ජේ.එන්.එම්.පී.කේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් (සහකාර රජයේ නියෝජිත) සහ 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ අණදෙන නිලධාරීතුමන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, පරිත්‍යාගශීලීන් සහ ප්‍රදේශවාසීන් පිරිසක් ද සහභාගි වූහ.

